VIDUS 19-2-12

# නවකයන් සඳහා සිය දැනුම දිගුකළ යුග පුරුෂයා

අමල් උඩවත්ත

පාසැල් අවධියට පෙරත්, පාසැල් අවධියේදීත්, පාසැල් අවධියෙන් පසුවත්, මේ වනතුරුත් මාගේ ගතත් සිතත් වෙලාගත් රෝගයක් විය. සිරුරට වැළඳෙන අන් රෝග වලට වඩා හාත්පසින්ම වෙනස්වූ මෙම රෝගයෙන් සිරුරට මෙන්ම මනසටද කිසිදු පීඩාවක් ගෙන දුන්නේ නැත. එහෙත් දිනෙන් දින උත්සන්න වූ මේ රෝගී තත්ත්වය නිසා මා හට වෘත්තීමය වශයෙන් විද්‍යා ලේඛනයත් හා පුවත්පත් කලාවත් තෝරා ගැනීමට සිදුවිය.

අතට හසුවන සෑම දෙයක්ම කියවීමේ රුචිය නැමති රෝගයෙන් පෙළුණු මගේ මෙම රෝගී තත්ත්වය දෙගුණ තෙගුණ කළ විද්වතුන් අතුරින් ප්‍රධාන වූ විද්වතුන් දෙදෙනකුද විය. ආචාර්ය ඒ.ඩබ්ලිව්. අදිකාරම් සහ මහාචාර්ය නන්දදාස කෝදාගොඩ යන ඒ විද්වතුන් දෙපොළයි. ආචාර්ය ඒ.ඩබ්ලිව්. අදිකාරම් සිය දාර්ශනික අදහස් කියා පෑ ලිපි වලින් මා ඔහුට සමීප වුවත් ඇසුරින් සමීප වූයේ නැත. එහෙත් වරක් හෝ දෙවරක් පමණ දැක තිබුණි. එහෙත් මහාචාර්ය නන්දදාස කෝදාගොඩයන් සිය අදහස් කියා පෑ ලිපි වලින් පැවැත්වූ දේශන වලින් මෙන්ම ඇසුරින්ද මා එතුමාට සමීප විය.

හැටේ දශකයේත් හැත්තෑව දශකයේත් ශ්‍රී ලංකාවේ පාසැල් ළමුන් අතර ජනප්‍රිය සඟරාවක් වූ "විද්‍යා" සඟරාවේ සංස්කරණ සාමාජිකයෙකු මෙන්ම ජනප්‍රිය ලේඛකයෙකුද වූ එතුමා අපට සමීප වූයේ දෙස්තර නන්දදාස කෝදාගොඩ යන නමිනි. එද එතුමා වෛද්‍ය වෘත්තියේ යෙදෙමින් විද්‍යා ලේඛකයෙක් ලෙස ගැඹුරු විදු වදන් සරලව පැහැදිලි කිරීමට දැක්වූයේ අපූරු දක්ෂතාවකි. එතුමා විසින් ලියන ලද ලිපි සහිත සඟරා අදත් මා ළඟ සුරැකිව පවතී. පාසැල් අවධියේදී මිතුරන් සමඟ මා එතුමන් විසින් ලියන ලද ලිපි කියවා ලැබුවේ අපූරු ආස්වාදයකි. අසීමිත දැනුමකි.

එතුමන්ගේ ලිවීමත් සරල වුවා සේම පැවැත්වූ දේශනද සරල මට සිලිටු බසකින්ද යුක්ත විය. මනා සංයමයකින් යුක්තව ඉවසීමෙන් නිරාකරණය කළ වෛද්‍ය ගැටළු වලින් ගුවන් විදුලියත් රූපවාහිනියත් ඔපවත් විය. මේ නිසාම අගනුවර වෛද්‍ය විද්‍යාලයේ සිට ඈත බිත්තැන්නේ වැදි ජනතාව දක්වා වූ සියලු ජන කොටස් මහාචාර්ය නන්දදාස කෝදාගොඩ වියතුන්ගේ හිතවතුන් විය.

හැටේ දශකයේත් හැත්තෑව දශකයේත්
ශ්‍රී ලංකාවේ පාසැල් ළමුන් අතර
ජනප්‍රිය සඟරාවක් වූ "විද්‍යා" සඟරාවේ
සංස්කරණ සාමාජිකයෙකු මෙන්ම ජනප්‍රිය
ලේඛකයෙකුද වූ එතුමා අපට සමීප වූයේ
දෙස්තර නන්දදාස කෝදාගොඩ යන නමිනි.
එද එතුමා වෛද්‍ය වෘත්තියේ යෙදෙමින්
විද්‍යා ලේඛකයෙක් ලෙස ගැඹුරු
විදු වදන් සරලව පැහැදිලි කිරීමට
දැක්වූයේ අපූරු දක්ෂතාවකි.

පාසැල් අවධියේ දී එතුමන් හා සමීප ඇසුරක් පැවැත්වීමට නොහැකි වුවත් පසුගිය අසූව දශකයේ අග භාගයේදී විද්‍යා සිසුන් කීප පොළක් එකතුවී කොළඹ ආනන්ද මහා විද්‍යාලයේදී පිහිටුවා ගත් ශ්‍රී ලංකා විද්‍යා ශිෂ්‍ය පදනම තුළින් එතුමා සමඟ විටින් විට ඇසුරු කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක්

විය. එතුමා විද්‍යා ශිෂ්‍ය පදනමේ ගරු අනුශාසක වරයෙක්ද විය. එතුමා සමග ආචාර්ය උපාලි එම්. සේනානායක, ආචාර්ය ග්‍රැන්විල් ධර්මවර්ධන, මහාචාර්ය වියුලි ද සිල්වා, මහාචාර්ය සරත් කොටගම, එඩ්වින් ආරිදස වැනි විද්වත්හු ද ගරු අනුශාසක ධුර දැරූහ. විද්‍යා ශිෂ්‍ය පදනමේ එක් සාංවත්සරික උත්සවයකදී පැවැත්වූ දේශනයක් ඇසුරින් ලිපියක් සකස් කිරීම මට අයත් වූ කාර්යභාරය විය. එදින පැවැත්වූ දේශන අතුරින් සිත්ගත් එක් දේශනයක් විය. ඒ මහාචාර්ය නන්දදස කෝදගොඩ විසින් පැවැත්වූ දේශනයයි. එතුමාගේ දේශනය හොඳින් අසා සිටි මා ඒ ඇසුරින් එදිනම රාත්‍රියේ දී ලිපිය ලියා අවසන් කළෙමි. **"නිහතමානී නොවන අය විද්‍යාඥයින් නොවේ"** යන්න එතුමාගේ දේශනයේදී කියවිනි. එම පාඨය මා විසින් සකස් කළ ලිපියේ සිරස් තලයට දමනු ලැබුවෙමි. එම ලිපිය විද්‍යා ශිෂ්‍ය පදනමේ පුවත්පත වූ "විදු පුවත්" සඟරාවේ මුල් පිටුවේම පළ විය. එවකට මා "විදු නැණ" පුවත්පතේ ආධුනික බාහිර ලේඛකයෙක්මි. ඉන් පසු දිනෙකද "විදුනැණ" පුවත් පතේද එම ලිපිය පළ විය. පළමු ලිපියත් රැගෙන මා, එහි කර්තෘ ධනසිරි බෝධිනායක මහතා සමග මහාචාර්යතුමන් හමු වීමට එතුමාගේ නිවසට ගියෙමු. එහිදී මහාචාර්ය තුමන්ට මාව හඳුන්වා දුන් බෝධිනායක මහතා මා විසින් ලියන ලද ලිපියද එතුමාගේ දැනට යොමු කළේය. මඳ වේලාවක් තුළ එම ලිපිය කියවා ලිපිය හොඳයි. මම කියපු දේවල් ලියල තියනවා. යනුවෙන් පවසා දේශනයක් කරනකොට හොඳින් අසා ඉන්න. අවශ්‍ය දේ සටහන් කරගන්න. පසුව නිදහසේ ලියන්න. එතකොට තමයි තමන්ටත් නොදැනීම හොඳ නිර්මාණයක් බිහි වන්නේ. යනුවෙන් කෙටි අවවාදයක් ද දුන්නේ අව්‍යාජ සිනහවක් මුවින් පළකරමිනි. එවකට ආධුනික විද්‍යා ලේඛකයෙකු වූ මා හට එම වදන් පෙළ ඉහළම සම්මානයක් විය. විද්‍යා ශිෂ්‍ය පදනම මෙහෙයවූ සෑම සම්මන්ත්‍රණයක් සඳහාම එතුමා නියමිත වේලාවට නොවරදවා පැමිණියේය. වෙලාවට කලින් පැමිණුනත්, වෙලාවට පසුව නම් පැමිණෙන්නේම නැත. නියමිත වේලාවට කටයුතු කිරීම එතුමාට කිසිදු අපහසුවක් නොවීය. සම්මන්ත්‍රණ වලට පැමිණීමෙන් පසු දේශනයක් පැවැත්වීම සාමාන්‍ය සිරිත විය. එහෙත් දේශනය කෙටි විය. එසේම අර්ථවත් විය. විටින්විට අපට හමුවන සෑමවිටම එතුමා කියා සිටියේ විද්‍යාව ගමට ගෙන යා යුතු බවයි. ඒ සඳහා යොදා ගත යුතු ප්‍රබලම මාධ්‍ය සිංහල භාෂාව බවත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම විද්‍යා දැනුම පුළුල් කිරීමට මහත් පිටුවහලක් වන බවත් එතුමා තරයේ ඇදහූ දෙයක් විය. සැබවින්ම එතුමා සිය ජීවිත කාලය පුරාම ක්‍රියා කළේ සිංහල භාෂාවෙන්, විද්‍යාව ජනප්‍රිය කරවීමටය.

පාසැලක විද්‍යා දිනය එතුමාගේ ප්‍රියතම දිනය විය. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වලදී එතුමා විසින් අසන ලද ප්‍රශ්න වලින් පාඨකයා අතරමං වන්නේද නැත. බිය වන්නේද නැත. එතුමාට ආවේනික වූ ප්‍රශ්න විචාරාත්මක ශෛලියක් විය. ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට පෙර, ඔබට කියන්න පුළුවන්ද? හොඳයි ඔබ කියන්න බලන්න. යනුවෙන් පටන් ගැනීම, එතුමාටම ආවේනික වූවක් විය. කිසියම් පිළිතුරක් දීමට අසමත් වන්නෙකුට ඒ ප්‍රශ්නය පිළිබඳව වූ පිළිතුර පහසු කිරීම සඳහා ඉඟි වැකි ලබාදීම නිරතුරුවම

> **පාසැලක විද්‍යා දිනය**
> **එතුමාගේ ප්‍රියතම දිනය විය.**
> **ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට පෙර**
> **ඔබට කියන්න පුළුවන් ද. හොඳයි**
> **ඔබ කියන්න බලන්න**
> **යනුවෙන් අසා පටන් ගැන්ම**
> **එතුමාට ආවේනික වූ**
> **ලක්ෂණයක් විය.**

කරන්නකි. ලැබෙන පිළිතුර සතුටින් බාරගැනීමත් එම පිළිතුර වඩාත් හොඳින් පැහැදිලි කිරීම සඳහා කරුණු ගෙනහැර දැක්වීමද එතුමා නිරතුරු කළ දෙයක් විය. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක මූලික අදහස පිළිතුරු ලබා ගැනීම වුවත්, එතුමාගේ උත්සාහය වූයේ අසන්නත් මෙන්ම පිළිතුරු දෙන්නන්ගේද දැනුම වඩාත් පෝෂණය කිරීමයි.

වසර 1995 දී ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා අධිකාරිය (නරේසා) විසින් මෙහෙයවූ විද්‍යා ලේඛක වැඩමුළුවකදී එතුමා අපට හමු විය. තෙදිනක් පුරා පැවති මෙම වැඩමුළුවේ දේශක විද්වතුන් අතර ප්‍රධාන විද්වතා වූයේද කෝදගොඩ වියතුන්ය. සෑම මාධ්‍ය ආයතනයක්ම නියෝජනය කරමින් විද්‍යා ලේඛකයින් රැසක්ම එම වැඩමුළුවට සහභාගි විය. වැඩමුළුව අවසන් දිනය ළඟා විය. එදින මමත්, නිහාල් පී. අබේසිංහත් මහාචාර්යතුමා හමු වී විද්‍යා ලේඛකයින්ගේ සංගමයක් පිහිටුවීමට අදහස් කරන බවත් එහි අරමුණ විද්‍යාව ජනප්‍රිය කරවීම බවත් කියා එතුමාගෙන් අවශ්‍ය උපදෙස් පැතුවෙමු. අප දෙදෙනාවත්, අපගේ අදහසුත් සතුටින් පිළිගත් එතුමා එදින සහතික පත් බෙදා දීමට පැමිණි එවකට මාධ්‍ය ඇමතිවරයාව සිටි ධර්මසිරි සේනානායක මහතාට අපගේ අරමුණත්, අදහසුත් පවසා කරුණු වැඩිදුරටත් පැහැදිලි කළේය. ඉන් සති දෙකකට පමණ පසු, මහාචාර්ය ප්‍රියානි ඊ සොයිසා, මහාචාර්ය පී.එල්.ඩී. වෛද්‍යසේකර, ආචාර්ය උපාලි එම්. සේනානායක, ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර, අනුර සිරිවර්ධන, තුසිත මලලසේකර, බී.එම්.සී.කේ. බස්නායක සහ පර්සි ජයමාන්න යන විද්වතුන් ඉදිරියේ, "නරේසා" ශ්‍රවණාගාරයේ දී විද්‍යා ලේඛකයින් රැසකගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා විද්‍යා සන්නිවේදක සංගමය මහාචාර්ය නන්දදස කෝදගොඩ විද්වතුන්ගේ උපදෙස් අනුව පිහිටුවීමට අපට හැකිවිය. පසුව සංගමයේ ව්‍යවස්ථාවට අවශ්‍ය කරුණු සැකසුවේද එතුමාය. සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පත්‍රද සැකසුනේ එතුමාගේ අතිනි. වසරකට වඩා වැඩි වයසක් ගතවූ විද්‍යා සන්නිවේදක සංගමය සක්‍රීය සංගමයක් බවට පත් කිරීමට මුල් අඩිතාලම වැටුණේ නන්දදස කෝදගොඩ මහාචාර්යතුමන් අතින් බව කියන්නේ අසීමිත ගෞරවයකිනි. ඉන් මාස ගණනාවකට පසු දිනක පැවැත්වූ සම්මුඛ

පරීක්ෂණයකට අනුව මාහට එතුමන් සංස්කරණ උපදෙස් දුන් "තරේසා" ආයතනයේ "විදුරාව" සඟරාවේ සංස්කාරක කටයුතු බාරගැනීමට සිදු විය.

මත්ද්‍රව්‍ය උවදුර එතුමා තදින්ම පිටු දැක්කේය. මත් උවදුර පිළිබඳව පාසැල් ළමුන් දැනුවත් කරමින් රටවටා ගියේය. ගුවන්විදුලිය, රූපවාහිනිය ඒ සඳහා ප්‍රබල මාධ්‍යයක් ලෙස යොදා ගත්තේය. දැනුමෙන් හා හැකියාවෙන් සංකීර්ණ පුද්ගලයෙකු වුවත් සරල පැවැත්මක් අගය කළේය. සිංහල භාෂාව කෙරෙහි දැක්වූයේ අසීමිත සෙනෙහසකි. අන් භාෂාවන් කෙරෙහිද දැක්වූ සෙනෙහසද අපමණය. කුඩා වුවත් අප රට බුද්ධිමතුන්ගෙන් හා විවිධ විෂය ක්ෂේත්‍රවල නිපුණ පුද්ගලයින් ගෙන්ද අඩුවක් නැත. එක් විෂය ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවී විවිධ ක්ෂේත්‍ර ගණනාවක නිපුණ හැකියාවන් ප්‍රකට කළ එතුමා කළ කී දේ නොනැසී පැවතුනත් එතුමා අද අප අතර නැත. එතුමාගේ දර්ශනය ඉදිරියට ගෙන යාමට කෙනෙකුද නැත.



**කුඩා දරුවන් අතර පවා සරල සිංහල බසින් විද්‍යාව ජනප්‍රිය කිරීමට ගත් වෙහෙස අපමණය**